# මාලිනී ජයසිංහ අනුස්මරණ කෙටිනාට්‍ය උළෙල දියත්වෙයි

## ජූලි 30 වන සෙනසුරාදා සවස 6.00 ට Chadler Comnunity රංග ශාලාවේ දී

කලාව කලාව සඳහා ද කලාව මිනිසා සඳහා ද යන නිර්වචනයන්ගේ කවරක් දෙසට හිත යොමු කලත් අවසානයේ මේ ද්විත්වයේ සම්බන්ධතාව සැමදා අපේ ජීවිත වලට එකතු කරන්නේ සොඳුරු මතකයන්ය. කලාව වෙනුවෙන් කැපවෙන්නන් සහ කලාව අගය කරන සියලුදෙනා දේශසීමාවකින් තොරව තම ජීවිතවලට එය ලංකරගන්නේ එයින් සාමාන්‍යයෙන් ගෙවන ජීවිතවලට වඩා එහි සමීපත්වයේ වටිනාකම දන්න නිසාය.



මාලිනී ජයසිංහ මහත්මිය මහාසාර නාටපයේ වෙස් ගැන්විමක යෙදෙමින්

සංක්‍රමිකයන් ලෙස ආගන්තුක සංස්කෘතියක් තුළ අපගේ වටිනාකම් සහ අපගේ සිරිත් විරිත් නොකඩවා පවත්වා ගැනීමට අප නොමසුරුව උත්සාහ ගත්තෙමු. ඒ අතර කලාව සම්බන්ධයෙනුත් අප වින්ද කලාව හා අප විඳින්න කැමති කලාව මෙම ආගන්තුක සංස්කෘතිය තුළ විවිධ අයුරින් පවත්වා ගැනීමට අප විවිධ උත්සහයක් ගන්නවා.

ඊටත් අමතරව පංසල් වෙහෙර බිහිවීමත්, ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධප්‍රසංග නිශ්පාදනය වීමත්, සිංහල අළුත් අවුරුද්ද වෙනුවෙන් අවුරුදු උත්සව සංවිධානය කිරීමත්, නැටුම් නිර්මාණ බිහිවීමත් සහ සිංහල වේදිකා නාට්‍ය බිහිවීමත් මේ අතර විශේෂ තැනක් ගන්නවා. නාට්‍ය කලාව සම්බන්ධයෙන් උනන්දුවක් ලැදියාවක් දක්වන මෙල්බන් වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් සංවිධානය කරන ˜ක්ෂී කෙටිනාට්‍ය උළෙල මෙවරද සාර්ථකව පැවැත්වීමට සියලු

***<u>නාට්‍ය උළෙලේ ආරම්භයේ සිට එහි ක්‍රියාකාරී චරිතයක් ලෙස සම්බන්ධ වී සිටි මාලිනී ජයසිංහ මහත්මිය ට කරන ගෞරවයක් ලෙස මෙවර නාට්‍ය උළෙල මාලිනී ජයසිංහ අනුස්මරණ කෙටිනාට්‍ය උළෙල ලෙස නම් කිරීමට තීරණය කර තිබෙනවා.</u>***

කටයුතු සූදානම් කර තිබෙනවා. නාට්‍ය කලාව සම්බන්ධයෙන් දිනෙන් දින වර්ධනය වන සුභදායී නැඹුරුව සහ ප්‍රජාවක් ලෙස තම කුසලතා කලා මාධ්‍යයක් ඔස්සේ ඉදිරිපත් කිරීමට හැකි උනන්දුව මෙල්බන් ශ්‍රී ලාංකික ප්‍රජාවෙන් අපි සෑහෙන කාලයක සිට දැක තිබෙනවා.

විශේෂයෙන් පැහැදිලි ඉතිහාසයක් ඇති මෙල්බන් පුරවරයට දිනෙන් දින නිර්මාණ සහ නිර්මාණකරුවන් වේදිකාව මත දැක ගැනීමට අපට අවශ්‍යතාව උදාවෙනවා. පසුගිය වසර තුළ SCATS කෙටිනාට්‍ය උළෙල හරහා තම නිර්මාණ කරුවන්ට ඔවුන්ගේ නිර්මාණ එළිදැක්වීමටත් ඒ තුළින් තමන්ගේ හැකියාවන් ඉදිරිපත් කිරීමට හැකි උනා.

මෙම කෙටි නාට්‍ය උළෙලේ ප්‍රධාන පරමාර්ථය හුදෙක්ම නාට්‍ය උළෙලක් පැවැත්වීම පමණක් නොවන අතර නාට්‍ය කලාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අයට අවස්ථාවක් උදාකර දීමත් ප්‍රමුඛ තැනක් ගන්නවා.

නාට්‍ය උළෙලේ ආරම්භයේ සිට එහි ක්‍රියාකාරී චරිතයක් ලෙස සම්බන්ධ වී සිටි මාලිනී ජයසිංහ මහත්මිය පසුගිය නාට්‍ය උළෙල දක්වා ඇගේ උපරිම දායකත්වය මෙහි සාර්ථකත්වය සඳහා ලබා දුන්නා. ඒ නිසා ඇයට කරන ගෞරවයක් ලෙස මෙවර නාට්‍ය උළෙල මාලිනී ජයසිංහ අනුස්මරණ කෙටිනාට්‍ය උළෙල ලෙස නම් කිරීමට තීරණය කර තිබෙනවා.

ජූලි මාසයේ 30 වන සෙනසුරාදා සවස 6.00 ට Chadler Comnunity රංග ශාලාවේ පැවැත්වීමට සූදානම් කර ඇති මාලිනී ජයසිංහ අනුස්මරණ SCATS කෙටිනාට්‍ය උළෙල නැරඹීමට මෙල්බන් වෙසෙන සියලුම දෙනාට මහඟු අවස්ථාවක් වේවි.

සරත් බණ්ඩාර

